# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 12 දරන
# විවාහ ලියාපදිංචි කිරීමේ
# (සංශෝධිත) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජූලි මස 17 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# 1997 අංක 12 දරන
# විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 15 වැනි දින]

එල්. ඩී.—ඕ.127/78(ii)

**විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1997 අංක 12 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඩු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයේ "වයස අවුරුදු විසි එකට අඩු" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅටට අඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

112 අධිකාරයේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (6) වන උපවගන්තියෙහි "රුපියල් දහයක වටිනාකම" යන වචන වෙනුවට "රුපියල් විසිපහක වටිනාකම" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 41 දරන පනතින් ප්‍රතියෝජනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"දෙවන උපලේඛනය (62 වන වගන්තිය)

| | කිනම් කාර්යයන් සඳහා ද යන වග | කවරකු හට ගෙවිය යුතු ද යන වග | කවරකු විසින් ගෙවනු ලැබිය යුතුද යන වග | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 1. | විවාහය පිළිබඳ දැන්වීමක් ස්වකීය කාර්යාලයේ දී ඇතුළත් කිරීම සඳහා | රෙජිස්ට්‍රාර්-වරයා | ඉල්ලුම්කරු | 10.00 |
| 2. | විවාහය පිළිබඳ දැන්වීමක් වෙනත් යම් ස්ථානයක දී ඇතුළත් කිරීම සඳහා | රෙජිස්ට්‍රාර්-වරයා | ඉල්ලුම්කරු | 75.00 |

| | කිනම් කාර්යයන් සඳහා ද යන වග | කවරකු හට ගෙවිය යුතු ද යන වග | කවරකු විසින් ගෙවනු ලැබිය යුතුද යන වග | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 3. | විවාහ පිළිබඳ දැන්වීමක් ස්වකීය කාර්යාලයේ දී හැර වෙනත් යම් ස්ථානයක දී ඇතුළත් කිරීම සඳහා | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්-වරයා | ඉල්ලුම්කරු | 100.00 |
| 4. | විවාහය පිළිබඳ දැන්වීමක් ස්වකීය කාර්යාලයේ දී හැර වෙනත් යම් ස්ථානයක දී ඇතුළත් කිරීම සඳහා | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්-වරයා | ඉල්ලුම්කරු | 125.00 |
| 5. | ස්වකීය කාර්යාලයේ දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 25.00 |
| 6. | ස්වකීය කාර්යාලයේ දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 25.00 |
| 7. | ස්වකීය කාර්යාලයේ දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 25.00 |
| 8. | 38(1) වන වගන්තිය යටතේ ස්වකීය කාර්යාලයෙන් පිටත දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 25.00 |
| 9. | 38(2) වන වගන්තිය යටතේ ස්වකීය කාර්යාලයෙන් පිටත දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 250.00 |
| 10. | 38(2) වන වගන්තිය යටතේ ස්වකීය කාර්යාලයෙන් පිටත දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 275.00 |
| 11. | 38(2) වන වගන්තිය යටතේ ස්වකීය කාර්යාලයෙන් පිටත දී විධිපූර්වකව විවාහයක් සිදු කිරීම සඳහා | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්-වරයා | විවාහයේ පාර්ශ්ව-කරුවන් | 300.00 |

| | කිනම් කාර්යයන් සඳහා ද යන වග | කවරකු හට ගෙවිය යුතු ද යන වග | කවරකු විසින් ගෙවනු ලැබිය යුතුද යන වග | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 12. | ලියාපදිංචි කරන ලද පොදු පූජනීය ස්ථානයක දී විධිපූර්වකව සිදු කරන ලද විවාහයක් ලියාපදිංචි කිරීම සඳහා | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා | විවාහයේ පාර්ශ්වකරුවන් | 20.00 |
| 13. | විවාහ දැන්වීමක් මත රෙජිස්ට්‍රාර් සහතිකය නිකුත් කිරීම සඳහා | රෙජිස්ට්‍රාර්වරයා | විවාහයේ පාර්ශ්වකරුවන් | 5.00 |
| 14. | විවාහ දැන්වීමක් මත රෙජිස්ට්‍රාර් සහතිකය නිකුත් කිරීම සඳහා | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා | විවාහයේ පාර්ශ්වකරුවන් | 5.00 |
| 15. | විවාහ දැන්වීමක් මත රෙජිස්ට්‍රාර් සහතිකය නිකුත් කිරීම සඳහා | දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා | විවාහයේ පාර්ශ්වකරුවන් | 5.00" |

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.